# කාර්යසාධන වාර්තාව 2016

# නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

**2016.01.01 – 2016.12.31**

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

අංක 80, 4 වන මහල, අධිකරණ මාවත, කොළඹ 12

www.lawcom.gov.lk

## 1. හැඳින්වීම

1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව පිහිටුවන ලද අතර, ශ්‍රී ලංකාවේ නීති කොමිෂන් සභාව නීති ප්‍රතිසංස්කරණ නිර්දේශ කරනු ලබන රජයේ ප්‍රධානම ආයතනය වේ. පරිපාලනය සඳහාත්, පර්යේෂණ සඳහා සහයෝගය ලබාදීම සඳහාත්, නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී.

## 2. දැක්ම

යහපාලනය උදෙසා නීතියේ ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම.

## 3. මෙහෙවර

නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම සඳහා 1969 අංක 3 දරන නීති කොමිෂන් සභා පනතේ දක්වා ඇති කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

## 4. අරමුණු සහ කාර්යයන්

නීති කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වනුයේ, නීති ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම වේ. එවැනි ප්‍රවර්ධන අරමුණු කරගනිමින් නීති කොමිෂන් සභාව මගින් පහත දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු ලබයි.

I. නීතිය සංග්‍රහ ගත කිරීම.

II. නීතියේ විෂමතා නැති කිරීම.

III. හරයාත්මක නීතිය මෙන්ම කාර්ය පටිපාටික නීතියද ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් සමාලෝචනය කිරීම සහ පවත්වාගෙන යාම.

IV. කාලෝචිත නොවන සහ අනවශ්‍ය පනත් ඉවත් කිරීම.

V. නීතිය සරල කිරීම සහ නවීකරණය කිරීම.

VI. නීති ප්‍රතිසංස්කරණය සඳහා වන යෝජනා භාරගෙන ඒවා සලකා බැලීම.

VII. ප්‍රතිසංස්කරණය කිරීමේ අදහසින් නීතියේ විවිධ අංශ පරීක්ෂා කිරීම සඳහා වන වැඩසටහන් කලින් කලට සකස්කොට අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

VIII. වෙනත් රටවල නීති ක්‍රම පිළිබඳව තොරතුරු ලබා ගැනීම.

IX. අනු නීති මනාව පිළිගත් සිද්ධාන්තවලට හා නීතියේ මහිමයට අනුකූල වන බව සුරක්ෂිත කිරීමේ අදහසින්, පාර්ලිමේන්තුව නොවන වෙනත් මණ්ඩල විසින්, අනු නීති සෑදීමේ බලය ක්‍රියාත්මක කිරීම නිරන්තරයෙන් සමාලෝචනය කිරීම.

X. නඩුකීම හා සම්බන්ධ පරිපාලනාත්මක ස්වභාවයේ කාර්ය පටිපාටිය ඇතුළුව නීති කාර්ය පටිපාටි තර්කාපණය කිරීම හා සරල කිරීම සඳහා වැඩසටහන් ක්‍රමානුකූලව සකස් කිරීම.

XI. සිංහල භාෂාවෙන්, දමිළ භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් නීතිය සංග්‍රහ ගත කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

නීති කොමිෂන් සභාවේ නව සමාජිකයන් ලෙස පහත නම් දක්වා ඇති අය පත් කරන ලදී.

1. ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා (සභාපති)
2. මහාචාර්ය ලක්ෂ්මන් මාරසිංහ මහතා
3. ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු මහතා
4. ජේ. එම්. ස්වාමිනාදන් මහතා
5. එන්. සෙල්වකුමාරන් මහතා
6. ජනාධිපති නීතිඥ එම්. ඉක්‍රම් මොහොමඩ් මහතා
7. ජනාධිපති නීතිඥ එස්. අනිල් සිල්වා මහතා
8. ජනාධිපති නීතිඥ ආචාර්ය හර්ෂ කබ්රාල් මහතා
9. ජනාධිපති නීතිඥ මනෝහාර ද සිල්වා මහතා
10. ජනාධිපති නීතිඥ සංජීව පී. ජයවර්ධන මහතා
11. ධාරණී එස්. විජේතිලක මිය
12. මහාචාර්ය කාමිනා ගුණරත්න මිය
13. ජී. ජී. අරුල්ප්‍රගාසම් මහතා
14. තිසත් විජේගුණවර්ධන මහතා
15. නවින් සුරත් මාරපන මහතා

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය:

- සෙව්වන්දි අබේසේකර මිය , ලේකම් (වැ.බ.) / නීති කොමිෂන් සභාව
- ලිලන්ති පතිනාගොඩ මිය, සහකාර ලේකම් / නීති කොමිෂන් සභාව

## 5. නීති කොමිෂන් සභාවේ කාර්යසාධන ප්‍රගතිය - 2016

### 2016 නිර්දේශිතයන්ගේ ප්‍රගතිය

1) ත්‍රස්තවාදී පනතෙන් ජාතික ආරක්ෂාව සුරැකීම.

| නිර්දේශිතය | ත්‍රස්තවාදී පනතෙන් ජාතික ආරක්ෂාව සුරැකීම. |
|---|---|
| පසුබිම | ත්‍රස්තවාදී ක්‍රියා හඳුනාගැනීම, වගකීම් ආකාර, අත්අඩංගුවට ගැනීමේ බලය, ඇතුළුවීමේ බලය, සෝදිසි කිරීමේ සහ අල්ලාගැනීමේ බලය, රැකවරණ නියෝග, නඩු විභාග පටිපාටිය, පාපොච්චාරණ, නඩු විභාග සහ අභියාචනා සඳහා ප්‍රමුඛත්වය, ඒකාබද්ධ වගකීම, නිලධාරීන් ආරක්ෂා කිරීම යනාදිය. |
| වත්මන් තත්ත්වය | 2016.02.17 වන දිනදී අවසාන කරන ලද පනත් කෙටුම්පත ගරු අධිකරණ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. ඊට අදාළ විශේෂ උනන්දුවක් ඇති අය සමඟ රැස්වීමක් අමාත්‍යාංශයේදී පවත්වන ලද අතර ආරක්ෂක අමාත්‍යාංශය සමඟ වෙනමම පනත් කෙටුම්පතක් සෑදීමට තීරණය කරන ලදී. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ද සංගමයේ සාමාජිකයෙකි. |

2) දැනට පවතින දික්කසාදය, භාරකාරත්වය සහ දික්කසාද දීමනා නීතිය සඳහා සංශෝධන.

| නිර්දේශිතය | දැනට පවතින දික්කසාදය, භාරකාරත්වය සහ දික්කසාද දීමනා නීතිය සඳහා සංශෝධන. |
|---|---|
| පසුබිම | පිළිසකර කරගත නොහැකි විවාහ බිඳවැටීම් සම්බන්ධයෙන් වන්නාවූ දික්කසාදය, දික්කසාද දීමනා සහ භාරකාරත්වය පිළිබඳව දැනට පවතින නීති සහ ආඥා පනත්,එම කරුණු පහසුවෙන් අවබෝධ කර ගත හැකි ලෙස ක්‍රමානුකූලව සකසා,එම නීති සහ ආඥා පනත් සියල්ලම එකට එකතුකර එක් ආඥා පනතක් ලෙස සංග්‍රහගත කිරීම.<br>• පොදු එකඟතාවක් ඇති අවස්ථාවක්.<br>• එක් පාර්ශවයකට දික්කසාදය අවශ්‍ය නොවන්නාවූ බැවින් අන්‍යෝන්‍ය එකඟතාවයක් නොමැති අවස්ථාවක්.<br>භාරකාරත්වය: දරුවාගේ යහපත වෙනුවෙන්.<br>දික්කසාද දීමනා:සාධාරණ සහ යුක්ති සහගත අධිකරණ බලය.<br>නඩත්තු: අධිකරණ බලය මහේස්ත්‍රාත් අධිකරණයකට නොව දිස්ත්‍රික් අධිකරණයකට පැවරිය යුතු අතර ඊට ඌනපූරකව එකතුකළ බලය ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් කිරීම සහ දඩුවම් පිණිස වන බලය දිස්ත්‍රික් අධිකරණය වෙත පැවරිය යුතුය. |
| වත්මන් තත්ත්වය | 2016.11.18 දිනදී,නීති කොමිෂන් සභාව විසින් ඉහත දක්වන ලද පනත් කෙටුම්පත අවසානාත්මකව සම්මත කරන ලදී. |

3) 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙනයාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනතට සහ විශේෂයෙන්ම එහි 11 වන වගන්තියට සංශෝධන.

| | |
|---|---|
| නිර්දේශිතය | 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙනයාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනතට සහ විශේෂයෙන්ම එහි 11 වන වගන්තියට සංශෝධන. |
| පසුබිම | ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම සම්බන්ධ නීතියට අදාළව ආරක්ෂාකාරී පියවර ඉදිරියට පැනවීම සඳහාය. |
| වත්මන් තත්ත්වය | 2016.09.08 වන දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදී, 2001 අංක 10 දරන ජාත්‍යන්තර ළමා පැහැරගෙන යාම පිළිබඳ සිවිල් ක්ෂේත්‍රයන්ට අදාළ සම්මුතිය පනතේ 11 (1) වගන්තිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පහත දක්වා ඇති යෝජනා නීති කොමිෂන් සභාව විසින් යෝජනා කරන ලදී.<br>1. " (ආ) ඒ ළමයා ආපසු යැවීමෙන් ඒ ළමයා ශාරීරික හෝ මානසික පීඩාවකට භාජනය වීමේ හෝ අන්‍යාකාරයකින් ඉවසිය නොහැකි තත්ත්වයකට පත්වීමේ බරපතල අවධානමක් ඇති බවට" යන විධිවිධානය ඉවත්කොට, ඊට " (ආ) *ළමයා ආපසු යැවීම ගැන ළමයාගේ වැඩි කැමැත්තක් නොමැති නම්*" යන විධිවිධානය එකතු කිරීම ; හෝ<br>2. (අ) සහ (ආ) එලෙසම තබාගෙන, " (ඇ) *ළමයා ආපසු යැවීම ගැන ළමයාගේ වැඩි කැමැත්තක් නොමැති නම්*" යන ලෙස ඇතුළත් කිරීම ; හෝ<br>3. "(ආ) *ළමයා ආපසු යැවීම ගැන ළමයාගේ වැඩි කැමැත්තක් නොමැති නම්* හෝ ඒ ළමයා ආපසු යැවීමෙන් ඒ ළමයා ශාරීරික හෝ මානසික පීඩාවකට භාජනය වීමේ හෝ අන්‍යාකාරයකින් ඉවසිය නොහැකි තත්ත්වයකට පත්වීමේ බරපතල අවධානමක් ඇති බවට" යනාදී වශයෙන් කියැවෙන ආකාරයට එම (ආ) වගන්තිය සංශෝධනය කිරීම.<br>2016.11.18 වන දිනදී, නීති කොමිෂන් සභාව විසින් ඉහත දක්වන ලද පනත් කෙටුම්පත අවසානාත්මක ලෙස සම්මත කරන ලදී. |

4) අත්අඩංගුවට ගැනීම සම්බන්ධව වත්මන් නීතිය සහ අවශ්‍ය සංශෝධන පිළිබඳ සලකා බැලීම.

| නිර්දේශිතය | අත්අඩංගුවට ගැනීම සම්බන්ධව වත්මන් නීතිය සහ අවශ්‍ය සංශෝධන පිළිබඳ සලකා බැලීම. |
|---|---|
| පසුබිම | දැනට පවතින *අත්අඩංගුවට ගැනීමේ පටිපාටි* සංශෝධනය කිරීම සඳහාය. |
| වත්මන් තත්ත්වය | ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන මහතා විසින් *වෙනත් අධිකරණ බල ප්‍රදේශවල අත්අඩංගුවට ගැනීමේ පටිපාටි* යන මැයෙන් සකස් කරන ලද පර්යේෂණ පනත් කෙටුම්පත, රැස්වීමේදී සභාගත කරන ලදුව සාකච්ඡා කරන ලදී.<br><br>එය 2016.10.27 වන දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදී, ඉන්දියාවේ අපරාධ යුක්ති සංග්‍රහය (Criminal Justice Code of India)සහ ඉන්දියානු නඩු නීතිය (Indian Case Law) සැලකිල්ලට ගනිමින් සාකච්ඡා කරන ලදී.<br><br>2016.11.18 දින පැවති නීති කොමිෂන් සභා රැස්වීමේදී, නීති කොමිෂන් සභාව විසින් ඉහත දැක්වූ පනත් කෙටුම්පත අවසානාත්මක ලෙස සම්මත කරන ලදී. |

## 6. 2016.01.01 සිට 2016.12.31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| විස්තරය | 2016 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු) | මු.රෙ 66 යටතේ මාරු කිරීම් | 2016 මුළු ශුද්ධ වෙන් කිරීම් | 2016.12.31 දිනට වියදම | 2016.12.31 මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 14,860,000 | (230,000.00) | 14,630,000.00 | 12,141,540.66 | 83% |
| ප්‍රාග්ධන වියදම් | 1,800,000 | 230,000.00 | 2,030,000.00 | 1,432,108.78 | 71% |
| එකතුව | 16,660,000 | | 16,660,000.00 | 13,573,649.44 | 81% |

## 7. මූල්‍ය කාර්යසාධනය (පුනරාවර්තන වියදම්) 2016/01/01 – 2016/12/31 දක්වා

| වැය විෂය | වැය විස්තර | 2016 අයවැය ඇස්තමේන්තුව රු. | මු.රෙ 66 යටතේ මාරු කිරීම | 2016 මුළු ශුද්ධ වෙන් කිරීම | 2016/01/01 සිට 2016/12/31 දක්වා මුළු වියදම් රු. |
|---|---|---|---|---|---|
| | පුද්ගල පඩිනඩි | | | | |
| 1001 | වැටුප් හා වේතන | 3,200,000.00 | 600,000.00 | 3,800,000.00 | 3,382,182.74 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 200,000.00 | - | 200,000.00 | 125,518.39 |
| 1003 | වෙනත් දීමනා | 5,400,000.00 | - | 5,400,000.00 | 4,315,593.17 |
| | ගමන් වියදම් | | | | |
| 1101 | දේශීය | 50,000.00 | - | 50,000.00 | 15,278.00 |
| 1102 | විදේශීය | 1,500,000.00 | - | 1,500,000.00 | 1,151,209.98 |
| | සැපයීම් | | | | |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 350,000.00 | 10,000.00 | 360,000.00 | 358,522.25 |
| 1202 | ඉන්ධන | 320,000.00 | - | 320,000.00 | 268,570.00 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 120,000.00 | 48,000.00 | 168,000.00 | 163,619.00 |
| | නඩත්තු වියදම් | | | | |
| 1301 | වාහන | 500,000.00 | - | 500,000.00 | 499,934.05 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 350,000.00 | (180,000.00) | 170,000.00 | 112,406.50 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 100,000.00 | (88,000.00) | 12,000.00 | 9,548.00 |
| | සේවා | | | | |
| 1402 | තැපැල් සහ සන්නිවේදනය | 500,000.00 | - | 500,000.00 | 273,142.07 |
| 1403 | විදුලිය සහ ජලය | 1,100,000.00 | - | 1,100,000.00 | 960,413.29 |
| 1405 | වෙනත් | 1,000,000.00 | (600,000.00) | 400,000.00 | 395,126.52 |
| | මාරු කිරීම් | | | | |
| 1502 | විශ්‍රාමික ප්‍රතිලාභ | 50,000.00 | (20,000.00) | 30,000.00 | 0 |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී | 120,000.00 | - | 120,000.00 | 110,476.70 |
| | එකතුව | 14,860,000.00 | (230,000.00) | 14,630,000.00 | 12,141,540.66 |

## 8. මූල්‍ය කාර්යසාධනය (ප්‍රාග්ධන වියදම්) 2016/01/01 – 2016/12/31 දක්වා

| වැය විෂය | වැය විස්තරය | 2016 සඳහා මුළු අයවැය ඇස්තමේන්තුව රු. | මු.රෙ 66 යටතේ මාරු කිරීම් | 2016 මුළු ශුද්ධ වෙන් කිරීම් | 2016/01/01 සිට 2016/12/31 දක්වා මුළු වියදම් රු. |
|---|---|---|---|---|---|
| | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | | | |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 100,000.00 | - | 100,000.00 | - |
| 2003 | වාහන | 200,000.00 | - | 200,000.00 | 198,775.84 |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | | | | |
| 2102 | ලී බඩු සහ කාර්යාල උපකරණ | 300,000.00 | 230,000.00 | 530,000.00 | 521,887.82 |
| | ශක්‍යතා වර්ධනය | | | | |
| 2401 | පුහුණු සහ ශක්‍යතා වර්ධනය | 1,200,000.00 | - | 1,200,000.00 | 711,445.12 |
| | එකතුව | 1,800,000.00 | 230,000.00 | 2,030,000.00 | 1,432,108.78 |

## 9. රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් "බී" ගිණුම - 2016 දෙසැම්බර් 31 දිනට

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීම්වල අවම සීමාව | හර ශේෂයන්ගේ උපරිම සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් : | 1,200,000.00 | 200,000.00 | 2,500,000.00 |
| වර්ෂය තුළ ප්‍රතිශෝධන සීමාවන් :* | - | - | - |
| වර්ෂය අවසානයේ සත්‍ය අගයන් : | 1,130,190.00 | 849,630.74 | 2,202,794.94 |

අත්තිකාරම් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2016

| | දෙපාර්තමේන්තු පොත් අනුව | භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ඉදිරියට ගෙන ආ ශේෂය (2016.01.01 දිනට) | 1,922,235.68 | 1,922,235.68 |
| එකතු කළා : වර්ෂය තුළ මුළු හර කිරීම් | 1,130,190.00 | 1,276,956.00 |
| අඩුකළා : වර්ෂය තුළ මුළු බැර කිරීම් | 849,630.74 | 996,396.74 |
| වර්ෂය අවසානයේ ශේෂය (2016.12.31 දිනට) | **2,202,794.94** | **2,202,794.94** |

## 10. 2016.12.31 වන දිනට කාර්ය මණ්ඩල සංයුතිය

| තනතුර | ශ්‍රේණිය | වැටුප් තලය | සේවා මට්ටම | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| ලේකම් | I | SL1/2016 | 1 | 1 | - | 1 |
| නියෝජ්‍ය ලේකම් | II | SL 1/2016 | 1 | 1 | - | 1 |
| සහකාර ලේකම් | III | SL 1/2016 | 1 | 4 | 2 | 2 |
| භාෂා පරිවර්තක | I | MN 6/2016 | 2 | 1 | 1 | - |
| ගිණුම් සහකාර නිලධාරී | III | MN 4/2016 | 3 | 1 | - | 1 |
| සංවර්ධන නිලධාරී | III | MN 4/2016 | 3 | 4 | 2 | 2 |
| පුස්තකාලයාධිපති | III | MN 3/2016 | 3 | 1 | 1 | - |
| කළමනාකරණ සහකාර නිලධාරී | III | MN 2/2016 | 3 | 8 | 2 | 6 |
| ලඝුලේඛිකා | III | MN 1/2016 | 3 | 1 | - | 1 |
| රියදුරු | III,II,I | PL 3/2016 | 4 | 4 | **4** | - |
| කා.කා.ස. | III,II,I | PL 1/2016 | 4 | 3 | 3 | - |
| එකතුව | | | | **29** | **15** | **14** |